# තනතුරු පුරප්පාඩු
# නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය
# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරුවල පුරප්පාඩු සඳහා තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විශිෂ්ට චරිතයකින් යුත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සේවා ගණය - ජ්‍යෙෂ්ඨ කළමනාකාර**

**අධ්‍යක්ෂ ජනරාල්**

**<u>සුදුසුකම්</u>**
**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

**(1)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/ ජනසන්නිවේදනය/ කළමනාකරණය/ සමාජවැඩ/ නීතිය/ වාණිජවේදී/ රසායනවිද්‍යාව/ ගිණුම්කරණය/ තොරතුරු තාක්ෂණය/ සංඛ්‍යානය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සමඟ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, පශ්චාත් උපාධියක් ලබාතිබීම/ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තිය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත / මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 18 ක පළපුරුද්දක් තිබිය යුතු අතර අවම වශයෙන් මින් වසර 03 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.

හෝ

**(2)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ මනෝවිද්‍යාව/ ජනසන්නිවේදනය / කළමනාකරණය/ සමාජ වැඩ/ නීතිය/ වාණිජවේදී/ රසායන විද්‍යාව/ ගිණුම්කරණය/ තොරතුරු තාක්ෂණය / සංඛ්‍යානය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබාතිබීම.

සමඟ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ආචාර්ය උපාධියක් ලබාතිබීම.

සහ

ඉහත සඳහන් ආචාර්ය උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක / දෙපාර්තමේන්තුවක පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 05 ක විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර 5 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සමඟ

බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහි ලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහි ලා නිශ්චිත ප්‍රවීනතාව ලබාතිබීම.

**වැටුප් කාණ්ඩය -** HM 2-1 – 2006

**වැටුප් පරිමාණය** - රු. 91,645 – 12x2,700 – 124,045/- වැටුප් පරිමාණය හිමිවේ. 2017 වර්ෂයේ මූලික වැටුප රු. 63,076/= මෙම තනතුරට රාජ්‍ය අංශයේ සමාන තනතුරුවලට හිමි වරප්‍රසාද හිමිවේ. දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ද ද්විතීය පදනම මත බඳවාගැනීමට සලකා බැලේ.

**වයස :** අවුරුදු 35ට නොඅඩු හා 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**සේවා ගණය - ජ්‍යෙෂ්ඨ කළමනාකාර**

**අධ්‍යක්ෂ - පරිපාලන**

**<u>සුදුසුකම්</u>**

**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, කළමනාකරණ/ වානිජවේදී/ මානව සම්පත් කළමනාකරණ/ රාජ්‍ය පරිපාලන යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සමඟ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15ක පළපුරුද්දක් තිබීම.

**අධ්‍යක්ෂ - මූල්‍ය**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

(1) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, මූල්‍ය/ ගිණුම්කරණ/ වානිජවේදී යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) සාමාජිකත්වය ලබා තිබීම හෝ වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ (ACCA) සාමාජිකත්වය ලබා තිබීම

සමඟ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15ක පළපුරුද්දක් තිබීම.

**(2)** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ පූර්ණ සාමාජිකත්වය.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15ක පළපුරුද්දක් තිබීම.

**අධ්‍යක්ෂ - ප්‍රතිකාර, පුනරුත්ථාපන හා බාහිර සේවා**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජවැඩ/ කළමනාකරණ/ වාණිජවේදී/ නීතිය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සමඟ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්දක් තිබීම.

**අධ්‍යක්ෂ - පර්යේෂණ**

**<u>සුදුසුකම්</u>**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජවැඩ/ සංඛ්‍යානය/ රසායන විද්‍යාව/ තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම

සමඟ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ පශ්චාත් උපාධියක් ලබාතිබීම

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්දක් තිබීම.

**අධ්‍යක්ෂ - මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපන හා පුහුණු**

**<u>සුදුසුකම්</u>**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජීය විද්‍යාවන් යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සමඟ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**<u>සුදුසුකම්</u>**

**අධ්‍යක්ෂ - පරිපාලන, අධ්‍යක්ෂ - මූල්‍ය, අධ්‍යක්ෂ - ප්‍රතිකාර, පුනරුත්ථාපන හා බාහිර සේවා, අධ්‍යක්ෂ - පර්යේෂණ, අධ්‍යක්ෂ - මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපන හා පුහුණු ( පහත සඳහන් 1 හෝ 2 )**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි මධ්‍ය කළමනාකාර සේවා ගනයෙහි I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5 ක අදාළ ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් කාණ්ඩය** - HM 1-1 – 2006

**වැටුප් පරිමාණය** - රු. 80,295/- 15 x 2,270/- රු. 114,345. 2017 වර්ෂයේ මූලික වැටුප රු. 55,236/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ඇතුලත්ය.)

**වයස** : අවු. 35 ට නොඅඩු හා අවු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

ඔබගේ තොරතුරු “A4” ප්‍රමාණයේ පිටුවෙහි දෙපසම ප්‍රයෝජනයට ගනිමින් මණ්ඩලයේ වෙබ් පිටුවේ: (**www.nddcb.gov.lk**) සඳහන් ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර (කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාළ සහතිකවල පිටපත් සමඟ **2017.10.23** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් **සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය** යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ/සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරින් තම අයදුම්පත් ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමු කළ යුතුය. අසම්පූර්ණ හා අයදුම්පත්, භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති**
**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**
**383, කෝට්ටේ පාර**
**රාජගිරිය.**

**දුරකථන : 2868794-6**
**ෆැක්ස් : 2868791--2**